# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2025.06.17 |

ඩබ්.ජී. වානක ප්‍රගීත් රවීන්ද්‍ර මයා,
නො:49/6, විහාර මාවත,
සුදුහුම්පල,
මහනුවර.

**පැමිණිලිකාර පාර්ශවය**

විදුහල්පති,
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

**වගඋත්තරකාර පාර්ශවය**

**<u>පැමිණිලි අංකය - HRC/KND/06/25 – I</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරු විසින් 2024.12.20 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ පැමිණිල්ල ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තම දරුවා වන ඔමික යසස්මින් වැවකුඹුර යන අය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ 2025 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය හා සහෝදර ගණය යටතේ අයදුම්පත් දෙකක් යොමු කළ බවත්, එම අයදුම්පත් දෙකම මහ/කිංස්වුඩ් විද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, ඊට හේතු ලෙස පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති බදු ඔප්පුව 2016 වර්ෂයෙන් අවසන් වීම, බදු මුදල් ගෙවා ඇත්තේ 2012 වර්ෂය සඳහා පමණක් වීම සහ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නිකුත් කර ඇති පදිංචිය තහවුරු කිරීමේ ලිපිය 2024.06.30 දිනෙන් පසුව එනම්, 2024.07.30 දින නිකුත් කර තිබීම යන කරුණු සඳහන් කරමින් ලිපි යොමු කර තිබූ බවත් ය.

ඒ අනුව බදු ඔප්පුව කල්පිරීමට හේතුව හා පදිංචිය තහවුරු කිරීමට අදාළව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නිකුත් කරන ලද ලිපිය 2024.06.30 දිනෙන් පසුව නිකුත් කිරීමට හේතු ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේ අවස්ථාව සලසා දෙන ලෙසට මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයාට දැනුම් දුන් බවත්, ඊට ප්‍රතිචාර නොදැක්වීම නිසා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

අවස්ථාව අහිමි වූ බැවින් අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසු 2024.12.17 දින අභියාචනා මණ්ඩලය වෙත කැඳවූ බවත්, ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් ලකුණු ලබා නොදීම හේතුවෙන් අභියාචන මණ්ඩලයට ද ලකුණු ලබා දීමට හැකියාවක් නොමැති බවට දැනුම් දුන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

කෙසේවෙතත් දුරකථන ඇමතුමක් ලබා දී 2024.12.18 වන දින නැවත මහ/කිංස්වුඩ් විද්‍යාලය වෙත කැඳවා සහෝදර ගණය යටතේ ලකුණු 21ක් ලබා දුන් බවත්, එම ලකුණු එකී ගණය යටතේ වන කඩඉම් ලකුණු සීමාව ඉක්මවීමට සමත් නොවීම මත තම දරුවා තේරීපත් නොවූ බවත්, මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට දැනුම් දීමෙන් පසු ලේකම්වරයා විසින් විදුහල්පතිවරයාට දැනුම් දුන්නද කිසිදු සහනයක් නොලැබුණු බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත. එසේහෙයින් ඉහත කී කරුණු සලකා බලා තමා හට සාධාරණ තීරණයක් ලබාදෙන ලෙස පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ප්‍රකාශ කර ඇත්තේ මෙම පැමිණිලිකරුගේ දරුවා මහ/ කිංස්වුඩ් විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා ආසන්න පදිංචිය සහ සහෝදර පදනම මත ගණ දෙකකින් අයදුම්පත් යොමු කර තිබූ බවත්, එහිදී පදිංචිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නිකුත් කර ඇති ලිපිය 2024.06.30වන දිනෙන් පසුව එනම්, 2024.07.30 වන දින නිකුත් කිරීම මත අංක 25/2024 චක්‍රලේඛයේ 17.0 අනුව සුදුසුකම් නොලබා ඇති බැවින් අයදුම්පත් දෙකම පළමු තෝරාගැනීමේ අදියරේ දී ප්‍රතික්ෂේප කරන ලද බවත් ය.

තවද, 2024.06.30 දින දක්වා අඛණ්ඩව බදු ගෙවූ බදු කුවිතාන්සි හෝ ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු විසින් කටයුතු කර නොතිබීම නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වූ බවත් වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් සඳහන් කර ඇත. පැමිණිලිකාර පාර්ශවය ප්‍රකාශ කරන අයුරින් බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් 2024.06.30 දින නිකුත් කරන ලද කිසිදු ලිපියකට ලකුණු ලබා දී නොමැති අතර එසේ පිළිගෙන ලකුණු ලබා දී ඇත්නම් එම ගොනු කුමක්ද යන්න තොරතුරු ලබා දෙන්නේ නම් ගොනු ඉදිරිපත් කළ හැකි බව ද වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරු විසින් සිය දරුවා වන ඔමික යසස්මින් වැවකුඹුර යන අය 2025 වර්ෂයේ මහ/කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්"යන ගණ දෙක යටතේම අයදුම් කර ඇති බවත්, එහිදී පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස විහාර හා

දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් සහතික කරන ලද 2024.07.30 දිනැති සහතිකය යොමු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එම අයදුම්පත් අතුරෙන් "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පතට අදාළව සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකාර පාර්ශවය නොකැඳවා ඇති බවත්, ඉහත කී පැමිණිලිකරු විසින් පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස ඉදිරිපත් කර ඇති විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද 2024.07.30 දිනැති සහතිකය, 2024.06.30 දිනයෙන් පසුව ලබා ගෙන තිබීම සහ බදු ඔප්පුව 2016 වර්ෂයෙන් අවසන් වීම මෙන්ම බදු මුදල් ගෙවා ඇත්තේ 2012 වසර දක්වා පමණක් වීම හේතුවෙන් යොමු අංක CO-525 යටතේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත ප්‍රතික්ෂේප කරන බවට වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2024.09.04 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු වෙත දැනුම් දී ඇති බවත් පෙනී යයි.

එසේම, "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" යන ගණය යටතේ යොමුකරන ලද අයදුම්පතට අදාළව බදු මුදල් අවසන් වරට ගෙවා ඇත්තේ 2012 වර්ෂයට වීම සහ එය ද 2024.06.30 දිනයෙන් පසුව ගෙවීම හේතුවෙන් යොමු අංක BR-40 යටතේ දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන් යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත ප්‍රතික්ෂේප කරන බවට වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2024.09.04 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු වෙත දැනුම් දී ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙලෙස පැමිණිලිකරුගේ අයදුම්පත් ද්විත්වයම ප්‍රතික්ෂේප වීම හේතුවෙන් ඓතිහසික සුදුහුම්පල රාජමහා විහාරයේ භාරකාර ස්වාමීන් වහන්සේ විසින් 2024.10.15 දිනැති ලිපිය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කරමින් ඓතිහසික සුදුහුම්පල රාජමහා විහාරයට අයත් අංක 49/6, විහාර මාවත, සුදුහුම්පල, මහනුවර ලිපිනයේ නිවස සඳහා පෙර බදු ලබා දී තිබූ පරලොව සැපත් ඩබ්. පී. විල්ෆ්‍රඩ් මහතා වෙනුවෙන් මේ වන විට බදු මුදල් ගෙවමින් වාර්ෂික බදුකරු ලෙස කටයුතු කරනු ලබන්නේ ඔහුගේ බිරිඳ වූ පී.පී. නන්දාවතී මහත්මිය විසින් බවත්, යථෝක්ත පරිශ්‍රය 1993 වකවානුවේ පටන් භුක්ති විඳිමින් හා ඊට අයත් බදු මුදල් ආදිය ද ගෙවමින් ඩබ්. පී. විල්ෆ්‍රඩ් මහතා විසින් ප්‍රයෝජනයට ගත් අතර ඔහු 2015 වසරේදී අභාවප්‍රාප්ත වූ බැවින් ඔහුගේ බිරිඳ වූ පී.පී. නන්දාවතී මහත්මිය සමඟ ඇයගේ දෙවන පුතු වන ඩබ්.පී. චානක ප්‍රගීත් රවීන්ද්‍ර මහතා (මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) ස්වකීය බිරිඳ සහ දරුවන් උක්ත ලිපිනයේ පදිංචිව සිටින බව සහතික කළ හැකි බවත්, නොබෝ දිනකදී දීර්ඝ කාලීන බදු ඔප්පුවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කරන බදු ඉල්ලුම්පත් ද මේ වන විට විහාරස්ථානය වෙත භාරදී ඇති බව, 2017 වසර අවසානය තෙක් ගෙවිය යුතු බදු මුදල් ගෙවා අවසන් කර ඇති අතර අනෙකුත් හිඟ බදු මුදල් නව බදු ඔප්පුව ලබාගැනීමට පෙර

ගෙවා අවසන් කරන බවට ලිපියක් මගින් පොරොන්දු වී ඇති බවත් දැනුම් දී ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, මෙලෙස අයදුම්පත් දෙකම ප්‍රතික්ෂේප වීමට අදාළව පැමිණිලිකරු විසින් අභියාචනා කර ඇති අතර "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" යන ගණය යටතේ අභියාචනය සලකා බැලීම සඳහා පැමිණිලිකරු 2024.12.17 වන දින මහ/කිංස්වුඩ් විද්‍යාලය වෙත කැඳවා ඇති නමුත්, මුල් අවස්ථාවේදී පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණය වෙත කැඳවා ලකුණු ලබාදීමක් සිදු කර නොමැති බැවින් අභියාචන මණ්ඩලයට ද ලකුණු ලබා දීමට හැකියාවක් නොමැති බව අභියාචන මණ්ඩලය විසින් පැමිණිලිකරු හට දැනුම් දී ඇති බවත්, ඊට පසු දින එනම්, 2024.12.18 වන දින පැමිණිලිකරු නැවත විද්‍යාලය වෙත කැඳවා ඇති බවත්, එහිදී "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" ගණය යටතේ යොමුකරන ලද අයදුම්පතට අදාළව 'දැනට පාසලේ ඉගෙනුම ලබන සහෝදරයින්' යන නිර්ණායකය සඳහා ලකුණු 16ක් සහ 'සහෝදරයා පළමු ශ්‍රේණියට ඇතුලත්ව ඉගෙනු ලැබීම' යන නිර්ණායකය සඳහා ලකුණු 05 ක් වශයෙන් ලකුණු 21ක් ලබා දී ඇති බවත්, එහිදී පදිංචිය සම්බන්ධයෙන් හැර අනෙකුත් ලේඛන සඳහා ලකුණු ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලට අදාළව 2025.01.28 වන දින කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් පදිංචිය සනාථ කිරීම සඳහා ලබා දෙන ලද ලිපිය 2024.06.30 දිනෙන් පසුව එනම්, 2024.07.30 වන දින නිකුත් කර ඇති බවත්, අංක 25/2024 චක්‍රලේඛයේ 17.0 අනුව සුදුසුකම් සපුරා තිබිය යුතු අවසාන දිනය 2024.06.30 වන බැවින් එදිනට පසුව නිකුත් කරන ලද ලිපි සලකා බැලීම සිදු නොකරන බවත් ය. එහෙත් පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රකාශ කරන ලද්දේ තමන් හා සමානව බෞද්ධ කටයුතු කොමසාරිස් භාරයේ ඇති ඉඩම් වල පදිංචි 2024.06.30 දිනෙන් පසු ලිපි නිකුත් කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇති බවත්, ඇතැම් අයදුම්කරුවන්ගේ දරුවන් පාසලට ඇතුලත් කරගෙන ඇති බවත් ය.

ඒ අනුව මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ 2025 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් ලිපි නිකුත් කරන ලද අයවලුන්ගේ ලේඛනයක් ලබාදෙන ලෙසට කොමිෂන් සභාව විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙතින් සිදු කළ ඉල්ලීමට අනුව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් 2025.02.18 වන දිනැති ලිපිය මගින් මහ/ කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් වීම සඳහා විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් ලිපි නිකුත් කරන ලද අයදුම්කරුවන් 28 දෙනෙකුගේ ලේඛනයක් යොමු කර ඇත.

එකී ලිපි නිරීක්ෂණයේදී පෙනී යන්නේ අදාළ ලිපි 2024.07.04 දිනෙන් පසුව නිකුත් කර ඇති බවයි. මෙම පැමිණිල්ලට අදාළව 2025.03.18 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී

අනාවරණය වී ඇත්තේ ඉහත කී අයදුම්කරුවන් 28 දෙනා අතුරෙන් පස්දෙනෙකු මහ/ කිංස්වුඩ් විද්‍යාලයට ඇතුලත් කරගෙන ඇති බවයි. පහත සඳහන් වගුවෙන් ඒ බව සනාථ වේ.

| යොමු අංකය | අයදුම්කරුගේ නම | බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් ලිපිය නිකුත් කර ඇති දිනය |
|---|---|---|
| CO-114 | යූ.එල්.ජී.එස්. පෙරේරා මයා | 2024.07.05 |
| CO-288 | ඩී. එම්. අයි.පී. දිසානායක මයා | 2024.07.25 |
| CO-289 | ඒ.පී.ආර්.එස්. කරුණාරත්න මයා | 2024.07.04 |
| CO-369 | පී.ජී.එන්. මංජුලා මිය | 2024.07.16 |
| CO-423 | යූ.ජී. හඳපහන්දුන්න මයා | 2024.07.22 |

2025.03.18 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ඉහත සඳහන් කරුණු පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයාගෙන් සිදු කළ විමසීමේදී ඔහු විසින් ප්‍රකාශ කළේ එම තෝරාගත් දරුවන් විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ ලිපියට අමතරව අඛණ්ඩව බදු ගෙවූ රිසිට්පත් හා බදු ඔප්පු ඉදිරිපත් කර තිබූ බවත්, එකී ලේඛන ද සලකා බලා ලකුණු ලබා දුන් බවත් ය. තෝරාගත් දරුවන්ගේ ලේඛන නිරීක්ෂණයේදී සියලුම අයදුම්කරුවන් විසින් අඛණ්ඩව බදු ගෙවා ඇති බවක් අනාවරණය නොවේ.

ඉහත කී අංක CO-288 යටතේ අයදුම් කර ඇති ඩී. එම්. අයි. පී. දිසානායක යන අය විසින් ඉදිරිපත් කර ඇති බදු ඔප්පුව අනුව 2011.08.01 වන දින සිට අවුරුදු 20ක් දක්වා අදාළ දේපළ භුක්ති විඳිය හැකි බවත්, ඊට අදාළ බදු මුදල් එක් එක් වර්ෂවල අගෝස්තු මස 01ට පෙර ගෙවා නිමකළ යුතු බවත් සඳහන් වුවද, එම කොන්දේසීන් අනුව බදු ගැනුම්කරු කටයුතු කර නොමැති අතර 2012 වසරේ සිට 2016 වසර දක්වා අවුරුදු 05ක් සඳහා එකවර රු.24,000.00ක මුදලක් ගෙවා ඇත්තේ 2024.07.21 වන දින වන බවත්, බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් අදාළ ලිපිය නිකුත් කර ඇත්තේ 2024.07.25 වන දින වන බවත් නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීමට අදාළ 25/2024 චක්‍රලේඛය ප්‍රකාරව 6.1 "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ (අ) පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ "විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික" දක්වා ඇති අතර, එකී ලේඛනය හෝ එහි සඳහන් වෙනත් ලේඛනයක් හෝ නොමැති නම් අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩව ස්ථිර පදිංචිකරුවෙකු ලෙස පදිංචිව සිටී නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන

වර්ෂයේ ජුනි 30 වන දින වන විට පූර්වාසන්න වර්ෂ 06ක් හෝ ඊට වැඩි කාලයක් වූ, පදිංචි ලිපිනය සනාථ කෙරෙන විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/ කලත්‍රයාගේ උප්පැන්න සහතික යන ලේඛන වලින් ලේඛන 04ක් සඳහා ලකුණු ලබාදිය හැකි බව සඳහන් කර ඇත.

ඒ අනුව පැමිණිලිකරු විසින් "විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික" යටතේ ඉදිරිපත් කරන ලද බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් සහතික කරන ලද 2024.07.30 දිනැති සහතිකය, එකී සහතිකයෙහි සඳහන් දේපළට අදාළ බදු ඔප්පුව 2016 වර්ෂයෙන් අවසන් වී තිබීම සහ අඛණ්ඩව බදු මුදල් ගෙවා නොමැති වීම යන කරුණු මත පිළිගත නොහැකි වූයේ නම්, වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් ඉහතින් සඳහන් කළ පරිදි පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/ කලත්‍රයාගේ උප්පැන්න සහතික යන ලේඛන පිළිබඳව සලකා බැලිය හැකිව තිබූ බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ. එසේම, මේ වන විට මහ/කිංස්වුඩ් විද්‍යාලයේ ඉගෙනුම ලබන පැමිණිලිකරුගේ අනෙක් දරුවා වන එස්.ආර්.ටී. වැවකුඹුර යන අය 2017 වර්ෂයේදී පාසලට ඇතුළත් කරන අවස්ථාවේදී ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පදිංචිය තහවුරු කිරීම සඳහා අදාළ කරගෙන ඇත්තේ එම ලේඛනයන් බව ද පෙනී යන බැවින් වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් මෙම අවස්ථාවේදී ඒ පිළිබඳව නිසි අවධානයක් යොමු කර නොමැති බව ද නිරීක්ෂණය වේ.

එසේ හෙයින් පැමිණිලිකරු "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමයින්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පතට අදාළව ඔහු හට සම්මුඛ පරීකෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා නොදීම සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු / සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්" යන ගණය යටතේ පසුව පැවති පරීක්ෂණයේදී නිසි පරිදි ලකුණු ලබා නොදීම යුක්ති සහගත නොවන බවද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත සලකා බැලීමේ දී අංක 25/2024 දරණ චක්‍රලේඛය අනුව 'පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන' යන නිර්ණායකයට අදාළව 'වෙනත් පිළිගත හැකි ලේඛන' යන්න යටතේ ඉදිරිපත් කර ඇති 2018, 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ හයෙහි පැමිණිලිකරුගේ නම සහ අංක 49/6, විහාර මාවත, සුදුහුම්පල, මහනුවර යන ලිපිනය සඳහන් විදුලි බිල්පත් සහ ජල බිල්පත් සඳහා ලකුණු 01 බැගින් ලකුණු 02ක් ද, එකී ලිපිනයෙහි පිහිටි දේපළ සඳහා 2018, 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ හයෙහි වරිපනම් බදු ගෙවූ බිල්පත් පැමිණිලිකරුගේ පියාගේ නමින් ඇති බැවින් ඒ

සඳහා ලකුණු 0.5ක් ද, පැමිණිලිකරුගේ උප්පැන්න සහතිකය සඳහා ලකුණු 01ක් ද වශයෙන් ලකුණු 3.5ක් පැමිණිලිකරු හට හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

එසේම, අංක 25/2024 දරණ චක්‍රලේඛය අනුව 'පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන' යටතේ පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලිකරුගේ ජාතික හැඳුනුම්පත, විවාහ සහතිකය, ළමයාගේ උප්පැන්න සහතිකය සහ බැංකු පොත යන ලේඛන සඳහා ලකුණු 04ක් ද, පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය යන්න යටතේ දරුවාගේ මව හා පියා යන දෙදෙනාම 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ පහ සඳහාම ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිට ඇති බැවින් ඒ සඳහා ලකුණු 25ක් ද, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව යටතේ සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ පිහිටා ඇති මහ/ කිංස්වුඩ් විද්‍යාලයට වඩා ආසන්න පාසල් දෙකක් ඇති බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති අතර එකී පාසල් වන මහ/ රාසිංදෙව් විද්‍යාලය සහ මහ/ මද්දුම බණ්ඩාර විද්‍යාලය සඳහා එක් පාසලකට ලකුණු 05 බැගින් ලකුණු 10ක් අඩු වූ විට ලකුණු 40ක් ද වශයෙන් මුළු ලකුණු 72.5ක් පැමිණිලිකරු වෙත හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් දැනුම් දී ඇති පරිදි "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ 2025 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ කඩයිම් ලකුණු සීමාව වී ඇත්තේ ලකුණු 78කි. ඒ අනුව එකී ගණය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු කැඳවූයේ නම් ඔහු හට ඉහතින් සඳහන් කළ පරිදි ලකුණු 72.5ක් හිමි වුව ද පැමිණිලිකරුගේ දරුවා අදාළ කඩයිම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු නොලබන බැවින් මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ ඇතුළත් වීමට සුදුසුකම් නොලබන බව කොමිෂන් සභාවට පෙනී යයි.

තවද, පැමිණිලිකරු විසින් "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්" යන ගණය යටතේ යොමුකරන ලද අයදුම්පතට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේදී 'දැනට පාසලේ ඉගෙනුම ලබන සහෝදරයින්' යන නිර්ණායකය සඳහා ලකුණු 16ක් සහ 'සහෝදරයා පළමු ශ්‍රේණියට ඇතුලත්ව ඉගෙනු ලැබීම' යන නිර්ණායකය සඳහා ලකුණු 05ක් වශයෙන් ලකුණු 21 ක් ලබා දී ඇත. එහෙත් පදිංචිය සම්බන්ධයෙන් වන ලේඛන සඳහා කිසිදු ලකුණක් ලබා දී නොමැත.

අංක 25/2024 දරණ චක්‍රලේඛය අනුව "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන්" යන ගණය යටතේ 'පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන' යන නිර්ණායකයට අදාළව 'වෙනත් පිළිගත හැකි ලේඛන' යන්න යටතේ ඉදිරිපත් කර ඇති 2018, 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ හයෙහි පැමිණිලිකරුගේ නම සහ අංක 49/6, විහාර මාවත, සුදුහුම්පල, මහනුවර යන ලිපිනය සඳහන් විදුලි බිල්පත් සහ ජල බිල්පත් සඳහා ලකුණු 0.5 බැගින් ලකුණු 01ක් ද, එකී ලිපිනයෙහි පිහිටි දේපළ සඳහා 2018, 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ හයෙහි වරිපනම් බදු ගෙවූ බිල්පත් පැමිණිලිකරුගේ පියාගේ නමින් ඇති බැවින් ඒ සඳහා ලකුණු

0.25ක් ද, පැමිණිලිකරුගේ උප්පැන්න සහතිකය සඳහා ලකුණු 0.5ක් ද වශයෙන් ලකුණු 1.75ක් පැමිණිලිකරු හට හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

එසේම, පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය යන්න යටතේ දරුවාගේ මව හා පියා යන දෙදෙනාම 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ පහ සඳහාම ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිට ඇති බැවින් ඒ සඳහා ලකුණු 20ක් ද, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව යටතේ සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ පිහිටා ඇති මහ/ කිංස්වුඩ් විද්‍යාලයට වඩා ආසන්න පාසල් දෙකක් ඇති බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති අතර එකී පාසල් වන මහ/ රාසිංදෙව් විද්‍යාලය සහ මහ/ මද්දුම බණ්ඩාර විද්‍යාලය සඳහා එක් පාසලකට ලකුණු 03 බැගින් ලකුණු 06ක් අඩු වූ විට ලකුණු 24 ක් ද වශයෙන් මුළු ලකුණු 66.75ක් පැමිණිලිකරු වෙත හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් විසින් දැනුම් දී ඇති පරිදි "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" යන ගණය යටතේ 2025 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ කඩයිම් ලකුණු සීමාව වී ඇත්තේ ලකුණු 32කි. ඒ අනුව එකී ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරු හට නිසි පරිදි ලකුණු ලබා දුන්නේ නම් ඔහු හට ඉහතින් සඳහන් කළ පරිදි ලකුණු 66.75ක් හිමිවන බැවින් පැමිණිලිකරුගේ දරුවා අදාළ කඩයිම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබන බැවින් මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" යන ගණය යටතේ ඇතුළත් වීමට සුදුසුකම් ලබන බව කොමිෂන් සභාවට පෙනී යයි.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකරු විසින් සිය දරුවා වන ඔමික යසස්මින් වැවකුඹුර යන අය 2025 වර්ෂයේ මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්"යන ගණ දෙක යටතේම අයදුම් කර ඇති බවත්, එම අයදුම්පත් දෙකම සම්මුඛ පරීක්ෂණ සඳහා ද නොකැඳවා ප්‍රතික්ෂේප කර ඇති බවත් නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීමට අදාළ 25/2024 චක්‍රලේඛය ප්‍රකාරව "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්"යන ගණ දෙක යටතේම පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ සඳහන් කර ඇති ලේඛන නොමැති නම් අයදුම්කරු/කලත්‍රයා අදාළ ලිපිනයේ අඛණ්ඩව ස්ථිර පදිංචිකරුවෙකු ලෙස පදිංචිව සිටී නම්, අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන වර්ෂයේ ජුනි 30 වන දින වන විට පූර්වාසන්න වර්ෂ 06ක් හෝ ඊට වැඩි කාලයක් වූ, පදිංචි ලිපිනය

සනාථ කෙරෙන විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත්, අක්කර බදු බිල්පත්, අයදුම්කරු/ කලත්‍රයාගේ උප්පැන්න සහතික යන ලේඛන වලින් ලේඛන 04ක් සඳහා ලකුණු ලබාදිය හැකි බව සඳහන් කර ඇත. එහෙත් ඒ ආකාරයෙන් කටයුතු නොකිරීම තුළින් පැමිණිලිකරු හට තම දරුවා මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා අවකාශය අහිමි වී ඇති බව තහවුරු වේ.

එසේම, ඉහතින් දැක්වූ පරිදි "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/ සහෝදරියන්"යන ගණය යටතේ පැවති සම්මුඛ පරීක්ෂණයේදී නිසි පරිදි ලකුණු ලබා දුන්නේ නම් ලකුණු 66.75ක් හිමි වන බව නිරීක්ෂණය වන බැවින් සහ එකී ලකුණු ප්‍රමාණය එම ගණය යටතේ අදාළ කරගත් කඩයිම් ලකුණු සීමාව ඉක්මවා යන බව නිරීක්ෂණය වන බැවින් අදාළ සුදුසුකම් සපුරා තිබියදී එම සුදුසුකම්, නිසි පරිදි සලකා නොබැලීම තුළින් වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම සහ නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය සිදු කර සිටී.**

පැමිණිලිකරුගේ දරුවා වන ඔමික යසස්මින් වැවකුඹුර යන අය මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 07 . 17 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව



පිටපත් අනෙක් පිටුවෙහි ඇත.

පිටපත් :- 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා

අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - අවශ්‍ය පියවර ගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) - කරුණු දැනගැනීම සඳහා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.